# ඩිජිටල් ලෝකයකින් මෙටාවර්ස් ඔබ වෙනස් කරාවි

**දවසකට වැඩ කරන පැය ගණන තුළ තාත්වික ලෝකයක ගත කළ හැකි බව ඔබ දන්නවාද? ඔබ කැමති රැකියාවක නිරත විය හැකි, සාප්පු සවාරි යාමට, චිත්‍රපට නැරඹීමට, ක්‍රීඩා කිරීමට, තමන් කැමති විෂයක් ඉගෙන ගැනීමට, තමන් කැමති පුද්ගලයකු හමුවීමට මෙන්ම සැබෑ ලෝකයේ තවත් අයකු සමඟ සාමාන්‍යයෙන් අත්විඳින සියලුම අත්දැකීම් අත්විඳිය හැකි තාත්වික ලෝකයක් ඉදිවෙමින් පවතී. එය හඳුන්වනු ලබන්නේ මෙටාවර්ස් නමිනි.**

මෙටාවර්ස් යනු තාත්වික යථාර්ථය තුළ නිර්මාණය වූ ඩිජිටල් ලෝකයකි. එම ලෝකය තුළ තවත් ලෝක කිහිපයක් පිහිටා ඇත. මෙටාවර්ස් සංකල්පය දැනටමත් පරිගණක ක්‍රීඩා ලෝකය තුළ ක්‍රියාත්මක වන අතර එහිදී ක්‍රීඩකයන් එකිනෙකා සමඟ සම්බන්ධවීමට මෙටාවර්ස් ලෝකය තුළ චරිත නිර්මාණය කරගනු ලබයි. එහිදී තමාට රිසි සේ තම චරිතය නිර්මාණය කර ගැනීමට ක්‍රීඩකයන්ට අවස්ථාව ලැබෙන අතර ඇතැම් ක්‍රීඩකයන් ස්ත්‍රී පුරුෂභාවය වෙනස් කරමින් තම චරිත නිර්මාණය කෙරේ.

මේ වන විට පරිගණක ක්‍රීඩාවලින් ඔබ්බට යමින් සංගීතඥයන් සහ නිෂ්පාදකයෝ මෙටාවර්ස් හි සංගීත ප්‍රසංග පැවැත්වීම පිළිබඳව අත්හදා බලමින් සිටිති. ලෝකයේ ප්‍රසිද්ධ ක්‍රීඩා සමාජ ද මෙටාවර්ස් හි තාත්වික තරග පැවැත්වීමට අවධානය යොමු කර ඇත. එහිදී සහභාගී වන්නන්ට තම ප්‍රියතම චරිතයට අදාල එන්.එෆ්.ටී. ක්‍රිප්ටෝ වත්කම් මිලදී ගැනීමට අවස්ථාව ලබා දීමටද අවධානය යොමුව ඇත.



මෙටාවර්ස් ලෝකය තුළ ක්‍රිප්ටෝ මුදල් ඒකක භාවිත වන අතර ක්‍රිප්ටෝ මුදල් ඒකක ලාභ ලැබීමේ අරමුණින් හඳුන්වා දී නොමැති බවත් හුදෙක් මෙටාවර්ස් ලෝකය තුළට පිවිසීමට, මිලදී ගැනීම් සිදුකිරීමට ක්‍රිප්ටෝ මුදල් ඒකක සහ ටෝකන් හඳුන්වා දී ඇති බවත් පැවසෙයි. මෙම අවස්ථාවේ මෙටාවර්ස් ලෝකයට පිවිසීමට වර්චුවල් හෙඩ්සෙට් එකක් අවශ්‍ය වුවත් මෙටාවර්ස් වර්චුවල් හෙඩ්සෙට් එකකට සීමා වියයුතු නැතැයි විශේෂඥයෝ පවසති.

2040 වසර වන විට මෙටාවර්ස් හි වඩාත් පරිපූර්ණ සියල්ල ඇතුළත් අත්දැකීමක් ලබා ගැනීමට හැකි වෙනු ඇති බවත් පුද්ගලයින් මිලියන 50 කගේ දෛනික ජීවිතවල වෙනස්කම් ඇති කරනු ඇති බවත් විශේෂඥයෝ කියති.

**විමුක්ති එස්. රුද්‍රිගු**

**(ඩේලිමෝල් ඇසුරිනි)**